**රේගු නිලධාරීන්ගේ ත්‍යාග අරමුදල - 2021**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

---

**1.1 තත්ත්වාගණනය කළ මතය**

---

රේගු ත්‍යාග අරමුදලේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2021 දෙසැම්බර් 31 දිනට අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

---

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-----------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරිබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් “මනාලෙස සැලසුම් කරන ලද” අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ. පොදු ලෙජරය, ජර්නලය, ජර්නල් වවුචර්, ගෙවීම් වවුචර් ආදී ප්‍රධාන ගිණුම්කරණ වාර්තා පවත්වාගෙන යාම සම්බන්ධ විගණන නිරීක්ෂණ පහත සඳහන් මාතෘකා යටතේ ඇතුලත් කර ඇත.

### 1.5.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසන් වන දිනට භාණ්ඩාගාර පොත් අනුව අරමුදලේ ශේෂය රු.1,214,115,436 ක් වූ අතර, අරමුදල් පොත් අනුව එම ශේෂය රු.1,202,851,043 ක් වූයෙන් රු.11,264,393 ක වෙනසක් නිරීක්ෂණය විය. | පිළිතුරු දක්වා නැත. | වෙනසට හේතු දක්වමින් සැසඳුම් ප්‍රකාශනයක් සකස් කිරීම. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වගකීම් යටතේ නිරූපනය කර තිබූ රු.144,744,167 ක Pool Payment payable හා රු. 37,418,587 ක Reward Refund Payable ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනයේ හිමිකම් ලෙස නිරූපනය කර තිබුණි. ඒ අනුව අදාල ගිණුම් අයිතමයක් නිසි පරිදි හඳුනා ගැනීමකින් තොරව වාර්තා කර තිබුණි. | මූල්‍ය ප්‍රකාශනය පිළියෙල කර ඇත්තේ මුදල් පදනම මත නොව වැඩිදියුණු කරන ලද මුදල් පදනම යටතේය. එය සටහන් අංක 2.1 හි පැහැදිලිව දක්වා ඇත. ඒ අනුව ගිණුම් අංශය වෙත ඉදිරිපත් කර එහෙත් අදාල මුදල් වර්ෂය තුළ ගෙවීම් කළ නොහැකි වූ ගෙවීම් හා උප අරමුදල් (Pool) යටතේ වෙන් කර ඇති එහෙත් එම වර්ෂය තුළ ගෙවීම් කර නොමැතිව ඉතිරිව ඇති මුදලද මෙයට | පිළිගත් ගිණුම්කරණ ක්‍රමවේදයට අනුකූලව ගිණුම් තැබීම. |

වසර කීපයක සිට ගෙවීම් ආපසු ලැබී ගිණුමේ පවතින රු.37,418,587 ක මුදලද (විශ්‍රාම ගිය හෝ මියගිය නිලධාරීන්ගේ) උපචිත වියදම් ලෙස ගිණුම්ගත කර ඇත.

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 1968 අංක 17 දරන රේගු ආඥා පනතේ 153 (2) (ආ) වගන්තිය | ත්‍යාග අරමුදලින් ත්‍යාග මුදල් බෙදා හැරීම සඳහා මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය ලබා ගෙන ඒ සඳහා සුදුසු ක්‍රමවේදයක් සකස් කල යුතුය .එසේ වුවත් 1988 ජනවාරි28 දින අංක පීඑල් 118 දරන දෙපාර්තමේන්තු නියෝගය සඳහා මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය ලබා ගෙන ඇති බවට තහවුරු කර ගැනීමකින් තොරව 1999 වසරේ සිට 2021 වර්ෂය දක්වා වූ වර්ෂ 23 ක් තුළ ත්‍යාග අරමුදල් ලෙස නිලධාරීන් සඳහා රු 18,624,256,063.ක්ද , ඔත්තුකරුවන් සඳහා රු 2,422,648,345.ක් ද බෙදා හැර තිබුණි. | දෙපාර්තමේන්තු චක්‍රලේඛ නිකුත් කිරීමේදී පනතේ විධිවිධාන අනුව අමාත්‍යවරයාගේ එකඟතාවය ලබා ගැනීම කළයුතු බැවින් මෙම DOPL 118 නිකුත් කිරීමට පෙරද මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය ලබාගත් බව උපකල්පනය කෙරේ. කෙසේ වුවද එහි පිටපතක් සොයා ගැනීමට මෙතෙක් හැකියාවක් ලැබී නොමැත. එසේ වුවද සෑම මුදල් වර්ෂයක් සඳහාම මෙම අරමුදලේ ලැබීම් හා ගෙවීම් සඳහා වාර්ෂික අයවැය ඇස්තමේන්තුවක් මුදල් ඇමතිවරයාට ඉදිරිපත් කර ඔහුගේ පෞද්ගලික අනුමැතිය ලබා ගන්නා හෙයින් මෙම අරමුදලේ වියදම් දැරීම සඳහා අනුමැතිය ලබා ගත්තා සේ සැලකිය හැකිය. කෙසේ වුවද, දෙපාර්තමේන්තු චක්‍රලේඛ 118 සංශෝධනය කිරීම සම්බන්ධයෙන් යෝජනා හා නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා මේ වනවිට කමිටුවක් පත් කර ඇති අතර එම කමිටුව විසින් ඉදිරිපත් කරනු ලබන නිර්දේශ අනුව එම දෙපාර්තමේන්තු නියෝගය සංශෝධනය කිරීමටත් ඒ අනුව අවශ්‍ය පරිදි අමාත්‍යාංශ ලේකම්ගේ හා ගරු මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය ලබා ගැනීමටත් කටයුතු කළ හැකි බව කාරුණිකව දන්වා සිටිමි. | අරමුදල් බෙදා හැරීම සුදුසු ක්‍රමවේදයක් සකස් කිරීම. |

## 2. මෙහෙයුම් සමාලෝචනය

## 2.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) හිඟ දණ්ඩන ආදායම් රැස් කිරීම.**<br>භාණ්ඩාගාරයට ඉදිරිපත් කරනු ලබන ත්‍රෛයිමාසික හිඟ දණ්ඩන ආදායම් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනවන විට රු.7,052,812,693 ක හිඟ දණ්ඩන ආදායම් පැවති අතර මේ පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල අන්තර්ගත වාර්තා අනුව ඉන් රු.5,921,928,174 ක් වර්ෂ 01 ත් 05 ත් අතර කාලයක් හිඟ පැවති අතර වර්ෂ 05 ඉක්ම වූ හිඟ දණ්ඩන ආදායම රු.1,098,976,593 ක් නිරීක්ෂණය විය. | විගණනය විසින් පෙන්වා දී ඇති හිඟ දණ්ඩන මුදල ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙන් අයවීමට නියමිතව තිබුණේ එම ආයතනය විසින් ගෙවිය යුතු නිෂ්පාදන බදු මුදල් නියමිත දින වකවානු තුළ නොගෙවා ප්‍රමාද කිරීම හේතුවෙනි. එහෙත් එසේ නොගෙවීමට හේතු වී ඇත්තේ තවත් රාජ්‍ය ආයතනයක් වන ත්‍රිවිධ හමුදාවන්, පොලිසිය සහ දුම්රිය දෙපාර්තමේන්තුව වැනි අත්‍යාවශ්‍ය සේවා සපයන රාජ්‍ය ආයතන වෙත ණයට ඉන්ධන ලබාදී ඒවා නොපියවීම හේතුවෙන් බව අභියාචනයක් මගින් දක්වා ඇති අතර මුදල් අමාත්‍යාංශය ද ඒ බව තහවුරු කර ඇත. | රාජ්‍ය ආදායම සුරක්ෂිත කිරීම පිළිබඳ අවධානය යොමු කර හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීම. |
| (ආ) රජයට ලැබිය යුතු බදු ආදායම ත්‍යාග ලෙස ගෙවීම<br>රේගු වැරදි සම්බන්ධව සිදු කරන රේගු විමර්ශනවලදී එම වැරදිවලට අදාලව ආනයනයන් සාමාන්‍ය ක්‍රමයට සිදු කරන ලද ආනයනයන් වූයේ නම් ඒ මත රජයට ලැබිය යුතුව පැවති අවම බදු ආදායමේ ප්‍රමාණය අයකර රාජ්‍ය ආදායමට බැර කිරීමට කටයුතු නොකර එම අහිමි වූ බදු ආදායම ද දණ්ඩනයක් සේ සලකා එසේ පනවන දණ්ඩන මුදලින් සියයට 50 ක් නිලධාරීන්ට හා ඔත්තුකරුවන්ට ත්‍යාග ගෙවීමට යොදා ගැනීම හේතුවෙන් රාජ්‍ය ආදායමට සිදු කරන අහිතකර බලපෑම පිළිබඳව වර්ෂ ගණනාවක සිට විගණනය විසින් පෙන්වා දී තිබුණි. එහෙත් ඒ පිළිබඳව කිසිදු සොයා බැලීමක් සිදු කර නොතිබුණි. මෙම තත්ත්වය නොසලකා හැරීම නිසා නිලධාරීන් වෙත බෙදාහරින ත්‍යාග | රේගු වරදක් දණ්ඩනයක් පැන වීමට හැකියාවක් ලැබෙන්නේ එම වරද අනාවරණය කර ගැනීමට නිලධාරීන් සූක්ෂම වී කටයුතු කරන නිසා ය. එසේ සූක්ෂම වී යම් වරදක් අනාවරණය කර ගත්තේ නැති නම් එම සිද්ධියට අදාල මුළු ආදායම් ප්‍රමාණයම ඇතැම් විට රජයට අහිමි වන මුදලක් බවට පත් වේ. නමුත් නිලධාරීන්ගේ දක්ෂතාවය මත එම රේගු වරද අල්ලා ගැනීමට හැකිවීම තුළ එකතු කර ගන්නා මුදලින් 30% ක ප්‍රමාණයක් රජයට ලැබෙන නිසා රජයේ ආදායමට යම් ප්‍රමාණාත්මක දායකත්වයක් ලැබෙන අතරම, නිලධාරින් තුළ රේගු වැරදි අල්ලා ගැනීමට ඇති වන පෙළඹවීම ද ඉහළ මට්ටමක පවත්වා ගැනීමට හැකි වේ. ප්‍රතිපත්ති සැලසුම් හා පර්යේෂණ අංශයෙන් වැඩිදුරටත් පිළිතුරු ලබා | රාජ්‍ය ආදායම සුරක්ෂිත වන සේ රේගු විමර්ශන සඳහා ත්‍යාග ගෙවීමේ වැඩ පිළිවෙලක් සැකසීම. |

| | | |
|---|---|---|
| මුදල්වල ප්‍රමාණය දිගින් දිගටම වැඩි වීමත් නිරීක්ෂණය වන අතර මේ සම්බන්ධයෙන් වැඩිදුර නිරීක්ෂණ පහත දැක්වේ. | ගැනීම සුදුසු වේ. | |
| (i) රටේ පවත්නා නිදහස් ආර්ථික ප්‍රතිපත්ති මත ආනයනයන්ගේ හා අපනයනයන්ගේ ඇති වී ඇති සංකීර්ණතාවයට ගැලපෙන අයුරින් රේගු ආඥා පනත මෙන්ම මෙම අරමුදල්වල නෛතික ප්‍රතිපාදන විධිමත්ව හා කාලීනව සංශෝධනය කිරීමේ අවශ්‍යතාවය පැවතිණි. | මේ පිළිබඳව වැඩිදුර සාකච්ඡා කිරීමට ඇති බැවින් පිළිතුරු ලබා දී නොමැත. | -එම- |
| (ii) රේගු ආඥා පනතේ 162 වගන්තියේ දැක්වෙන පරිදි රේගු නියමයන් කඩකිරීම සම්බන්ධයෙන් අදාල වන දෑ පිළිබඳව රේගු අධ්‍යක්ෂවරයාට සුදුසු පරිදි ක්‍රියා කිරීමට බලය පවරා තිබුණි. එහෙත් රාජ්‍ය ආදායම සුරක්ෂිත කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රේගුව විසින් දක්වන අවධානය සතුටුදායක මට්ටමක නොපැවතුණි. | -එම- | -එම- |

**3. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**3.1 වාර්ෂික කාර්යසාධනය**

1968 අංක 17 දරන රේගු ආඥා පනතේ 153 (2) (ආ) වගන්තිය ප්‍රකාරව විවිධ රේගු වැරදි සඳහා පනවනු ලබන දණ්ඩන මුදල් සහ රාජසන්තක කළ භාණ්ඩ විකිණීමෙන් ලැබෙන මුදල්වලින් සියයට 50 කට සමාන මුදල් ප්‍රමාණයක් රේගු නිලධාරීන්ගේ ත්‍යාග අරමුදලට බැර කරනු ලබන අතර රේගු බදු වංචාවන් අනාවරණය කරගැනීම, පාලනය කිරීම හා වැළැක්වීම වැනි අරමුණු පෙරදැරි කරගෙන නිලධාරීන්ට හා ඔත්තුකරුවන්ට ත්‍යාග ලබාදීම සඳහා මෙම අරමුදල පිහිටුවා තිබේ. 2012 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා වූ වසර 09 ක කාලය තුල මෙම අරමුදලින් නිලධාරීන්, ඔත්තුකරුවන් හා විවිධ සේවා සපයන අංශ වෙනුවෙන් වූ උපඅරමුදල් සඳහා මුදල් වෙන් කරනු ලැබේ. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කෙරුණි.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | -------------------------- | ---------------------------------------- | ------------- |
| (අ) | 2012 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා එකතුව රු.14,778,000,068 ක මුදලක් නිලධාරීන් හා ඔත්තුකරුවන් අතර බෙදා හැර තිබුණු අතර, මින් රු.12,910,816,963 ක් හෙවත් සියයට 87.36 ක් නිලධාරීන් වෙත ගෙවා තිබුණි. තවද පසුගිය වර්ෂයට සාපේක්ෂව 2021 වර්ෂයේ නිලධාරීන්ට ගෙවා තිබූ ත්‍යාග අරමුදල සියයට 118.4 ක වර්ධනයක් පෙන්නුම් කර තිබුණි. | මෙම රේගු නිලධාරීන්ගේ පොදු තැන්පත් ත්‍යාග අරමුදලට මුදල් බැර වන්නේ විමර්ශන ගොනුව අවසන් වී ත්‍යාග ගොනුව ගෙවන අවස්ථාවේදීය. 2021 වර්ෂයේ පෙර වර්ෂ වලට සාපේක්ෂව ත්‍යාග ගොනු විශාල ප්‍රමාණයක් ගෙවීම් සිදුකර ඇත. එබැවින් ත්‍යාග අරමුදලේ වර්ධනයක් පෙන්නුම් කරයි. තවද, 2021 වර්ෂයේ ගෙවීම් සිදු කරන ලද්දේ වැඩි වශයෙන් 2018, 2019, 2020 වර්ෂවල අවසන් කරන ලද විමර්ශන වෙනුවෙන් වන ත්‍යාග ගොනු සඳහා වන බැවින් කෝවිඩ් වසංගතය හේතුවෙන් ආනයන සීමා කිරීම මේ සඳහා බලපා නොමැත. | අරමුදල් පරිහරණය පිළිබඳව අවධානය යොමු කර සුදුසු පියවර ගත යුතු වීම. |
| (ආ) | ත්‍යාග අරමුදලේ උප අරමුදලක් වන ඉන්ධන අරමුදලට සමාලෝචිත වර්ෂයේදී රු.62,611,784 ක් බැර කර තිබුණි. එම අරමුදල පිහිටුවීමේ අරමුණු ලෙස රේගු විමර්ශන සඳහා අවශ්‍ය ඉන්ධන වියදම් පියවා ගැනීම බව දක්වා තිබුණ ද, විමර්ශන කටයුතු සඳහා දරන ඉන්ධන පිරිවැය දෙපාර්තමේන්තුවේ පොදු වැය ශීර්ෂයට වැය බරක් වී තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළ එම අරමුදලෙන් කිසිදු වියදමක් දරා නොතිබුණි. එසේ වුවද සාධාරණ අවශ්‍යතාවයන් නොසලකා දිගින් දිගටම මෙම අරමුදලට මුදල් රැස්කර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට එහි ශේෂය රු.651,419,513 ක් වී තිබූ අතර අරමුදලට කිසිදු වැය බරක් නොකර පොදු වැය ශීර්ෂයට අදාල ප්‍රතිපාදනවලින් එම වියදම දරා ඉතිරි කර ගත් මෙම මුදල් අරමුදලෙහි අතිරික්තයක් ලෙස පෙන්වා තිබුණි. | විගණන නිරීක්ෂණය හා එකඟ වේ. කෙසේ වුවද මෙම ඉන්ධන අරමුදල පිහිටුවීම මූලිකව අරමුණකොට ගෙන ඇත්තේ රේගු විමර්ශන සඳහා යම් අතිරික්ත ඉන්ධන අවශ්‍යතාවයක් ඇති වුවහොත් ඒ සඳහා යොදා ගැනීමටත්, LTTE යුදමය තත්ත්වය ඇතිවීමට පෙර රේගු දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කළ රේගු නිවාරණ කටයුතු සඳහා යොදා ගන්නා ලද නාවික අංශයෙහි (Marine Unit) ඉන්ධන අවශ්‍යතාවය සපුරා ගැනීමටත් වේ. පැවති යුදමය වාතාවරණය තුළ මෙම අංශය අක්‍රිය වීම තුළ මෙම අරමුදලේ ශේෂය සමුච්චිත වී ඇත. තවද Covid වසංගත කාලය තුළ විමර්ශන වෙනුවෙන් යාම අඩුවීම මත ඉන්ධන සඳහා වෙන් කළ ප්‍රතිපාදනයන්හි ඉතිරිවීමක් තිබූ බැවින් මෙම අරමුදල යොදා නොගැනුණි. | -එම- |
| (ඇ) | ත්‍යාග අරමුදලේ උප අරමුදලක් වන මත්ද්‍රව්‍ය වැටලීම් සඳහා සහභාගි වන නිලධාරීන් වෙනුවෙන් ගෙවීම් සඳහා වන මත්ද්‍රව්‍ය නිවාරණ අරමුදල (නාකොටික් අරමුදල) වර්ෂය තුළ රු. 22,847,367 ක වර්ධනයක් දක්නට ලද නමුත් වර්ෂය තුළ ගෙවා ඇති මුදල රු.7,910,000 ක් පමණි. | නිරීක්ෂණය හා එකඟ වේ. දෙපාර්තමේන්තු චක්‍රලේඛ ප්‍රකාරව මෙම උප අරමුදලට අදාල අරමුදල් මාරු කර ඇති අතර, දෙපාර්තමේන්තු චක්‍රලේඛ පදනම් කොට ගෙන වර්ෂය තුළ සිදු කරන ලද ඉල්ලීම් සඳහා අදාළ ගෙවීම් සිදු කර ඇත. | -එම- |

(ඇ) 2016 වර්ෂයේ සිට 2021 දක්වා වර්ෂ 05 ක කාලය තුළ වැඩිම ත්‍යාග ලැබූ නිලධාරීන් සියදෙනා අතර රු. 3,924,053,810 ක් ත්‍යාග ලෙස බෙදා තිබුණි. ඒ අනුව එක් නිලධාරියෙකුට ගෙවා ඇති ත්‍යාග මුදලේ සාමාන්‍යය රු.මිලියන 39 ක් පමණ විය. තවද මෙම කාලය තුළ එක් අයෙකුට රු.මිලියන 60 කට ත් වඩා වැඩිපුර ත්‍යාග ගෙවා තිබූ අවස්ථා 05 ක් විය. විස්තර පහත දැක්වේ.

| බෙදී ගොස් ඇති මුදල් රු. (මිලියන) | බෙදී ගොස් ඇති වාර ගණන |
|---|---|
| 02 – 10 | 162 |
| 11 – 19 | 65 |
| 20 – 29 | 33 |
| 30 – 39 | 13 |
| 40 – 49 | 03 |
| 50 – 59 | 03 |
| 60 ට වැඩි | 05 |
| එකතුව | 284 |

ත්‍යාග ගොනුවලට මුදල් ගෙවීම සිදු කරනු ලබන්නේ එකී විමර්ශන ලිපිගොනුව පිළිබඳව කටයුතු කරන ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂවරයාගේ අනුමැතිය මත අදාල විමර්ශනයට සහභාගී වූ නිලධාරීන් වෙනුවෙනි. එබැවින් වැඩිම ත්‍යාග මුදල් ලැබූ නිලධාරීන් හා අදාල විස්තර අදාල විමර්ශන සිදු කරනු ලබන අංශ වලින් පිළිතුරු ලබා ගැනීම සුදුසු වේ.

-එම-